


"ස"

"සම්බුද්ධ සද්ධර්ම අනුහසින්"
තිරපට මෑත් වෙයි.
අඳුර අතරින් වේදිකාවේ එක් පුද්ගලයෙකු
ආලෝකමත් වෙයි.
සුවහසක් සවන් යුග ප්‍රීතියෙන් උදම් කරවූ
ගාන්ධර්වයා ය ඒ.....
හේ නමින් වික්ටර් රත්නායක නම් වන්නේය.

පසුබිමින් දැවැන්ත සිංහල අක්ෂරයකි.
සප්ත ස්වරයේ මුල් අක්ෂරය වන "ස"
අක්ෂරයයි ඒ.
ප්‍රේක්ෂකාගාරය නිහඬය.
ස්තෝත්‍ර ගායනය පසු බිමින් තාල තරංග හඬ
සෙමෙන් නැගී එයි.
වාද්‍ය වෘන්දය දෙසට ද කෙමෙන් ආලෝකය
යොමු වෙයි.

ප්‍රසංග වාර එක්වා දහස් හාරසිය හතළිස් නවයක් වේදිකා ගත වූ "ස" අද්විතීය ඒක පුද්ගල සංගීත ප්‍රසංගයේ අවසන් දැක්මේ ආරම්භයයි ඒ. වසර 39 කට පෙර මුලින්ම ප්‍රසංගය ඉදිරිපත් කළ හැව්ලොක් ටවුමේ ලුම්බිණි රඟහලේ වේදිකාවේදීම මහාචාර්ය සුනිල් ආරියරත්නයන්ගේ මූලිකත්වයෙන් පැවැත්වුණ අවසන් දැක්ම ද මුල් ම දැක්ම මෙන්ම ප්‍රේක්ෂකයින්ගෙන් පිරී ඉතිරී ගියේ ය.

අන්තිම "ස" ප්‍රසංගය බලන්න ගිහින් පන්හිඳ බොහොම සංවේදී වෙලා ගෙදර ඇවිත් ලියවිල්ලක් පටන් ගත්තා. ඒ වැඩේට බාදා කරන්න පින්සලටවත් පැන්සලටවත් ඕන වුණේ නෑ. ඒ අයත් "ස" ප්‍රසංගයේ තම තමන්ගේ අත්දැකීම් ලෝකයේ අතරමං වෙලා. ඔහේ බලා ගත්ත අතේ බලං ඉන්නවා.

"කොට කලිසං ඇඳන් ඉස්කෝලෙ යන කාලෙ ඉඳන් "ස" කී වතාවක් බලන්න ඇත්ද ? නව රඟහලේ ගේට්ටුවෙන් ඇතුලට යා ගන්න බැරිව කී වතාවක් ආපහු හැරිලා ආවද ?



සිසිර දිසානායක

වැල්ලවත්තෙ රාමක්‍රිෂ්ණා ශාලාවට පිටිපස්සෙන් ඇතුල් වෙන හොර පාර හොයා ගත්තෙ "ස" බලන්නමයි. ඒත් ශාලාවට ඇතුල් වෙන්න ලැබෙන්නෙ ලයිට් නිවලා ප්‍රසංගය පටන් ගත්තම. දොරකඩ රැකවල් ගෙන ඉන්න අයියලාට කන්නලව් කරලා කොහොම හරි රිංග ගන්නවා. ඒ ටිකට් ගන්න සල්ලි නැති කාලෙ. පැන්සල තමුන්ගෙ අතීතෙට ගියා. පෙම්වතියො කී දෙනෙක් එක්ක "ස" බලන්න ඇත්ද පස්සෙ කාලෙක. අන්තිමේ දී බිරින් දෑ එක්ක. පස්සෙන් පහු ළමයිනුත් එක්කත්. පැන්ට එංගලන්තයේ ඉන්න අඹු දරුවො සිහි වුණා. එහේදිත් "ස" බලපු හැටි මතක් වුණා.

පින්සල හිටියෙ වෙන ම ලෝකෙක. "ස" පෝස්ටර් එකතු කරන එක ඒ දවස්වල පින්ගේ විනෝදාශයක් වෙලයි තිබුණෙ. රෑ නිදි මරාගෙන බලං ඉන්න වැලිකඩ හන්දියේ පෝස්ටර් අලවනකං. අරහෙන් අලවගෙන යනකොට මෙහෙන් ගලවගෙන එනවා. අලවන අයගෙ අතට අහුවුණානං පිහියා ඇණුං කන්ඩ තමයි වෙන්නෙ. තනියමත් නෙවෙයි ඕවට ගියේ. පන්හිඳයි, පැන්සලයි දෙන්නවත් හවුල් කරගෙන. පෝසටර් තුනක්වත් ගලවගත්තෙ නැති දාට තුන්දෙනා අතරෙයි යුද්දෙ පටන් ගන්නෙ. බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ තිබුණු පනස්වෙනි ප්‍රසංගයේ පෝස්ටර් පින්ට අද වගේ මතකයි. රත්නායක මහත්තයා කොණ්ඩෙ වවන්න කලින් ගත්ත පින්තූරයකුයි එකේ තිබුණෙ. පසු බිම කළු පාටයි. ඒක ඒ කාලෙ රුපියල් 100 කටත් ඉල්ලුවා තවත් පන්ති මිත්‍රයෙක්. ඉස්කෝලෙ කොල්ලෙකුට රුපියල් 100 ක් කියන්නෙ ලොකු දෙයක් ඒ කාලේ. ඒත් පින් නෙවෙයි පෝස්ටරේ විකුණුවෙ.

"ස" පෝස්ටර් වෙනම ම කලාවක් කලාවක් වුණා. ඒවයෙ උන්නු වික්ටර් රත්නායක මහත්තයාව වගේම තිබුණ අනික් දේවලුත් පින් අඳින්න උත්සාහ කළා. තාම්පුරාවක් තුරුළු කරගත්ත නිරුවත් නිරූපිකාවකගේ රූපය තිබුණ පෝස්ටරය අපූරු කලා නිර්මාණයක් වුණා. වාඩිවෙලා ඉන්න නිරූපිකාවගේ උකුලයි, ඉණයි හරියටම තාම්පාරාවේ උකුලෙයි ඉණෙයි හැඩේට එන්න කරපු ඒ කලා නිර්මාණය වැඩි දියුණු කරලයි පින් "ගී සඳැළුව" ලිපියේ ලාංඡනයට ගන්න නිර්මාණය කළේ.

පින්ගේ චිත්‍ර නිර්මාණවලට ඒ දවස්වල මාතෘකාව වුණේම වික්ටර් රත්නායක මහත්තයාගේ සින්දු. "තොටුපොළ අයියෙන්", "තනි තරුවේ", "ගිගිරි ගීත රාවේ" එවායින් දෙකක් තුනක් "ස" අකුර එක එක විදියට ඇඳලා තමන්ම ඒ දිහා බලලා සතුටු වුණා. දැන් දැන් අඳින කරන දේවල්වලදි ඕවා එළියට එනවා.

ඒ දවස්වල කැසට් පටි තිබුණෙ නෑ. වික්ටර් රත්නායක මහත්තයාගේ සිංදුවක් රේඩියෝ එකේ යනවා ඇහුණොත් පන්හිඳ කොහොම හරි ලියාගන්නවා. ඊටපස්සේ පිළිවෙලකට මොනිටර් ඇක්සයිස් පොතක ලියනවා. පින්සලගේ චිත්‍රත් පොතට ගන්නවා. ගීතය ලිව්වෙ කවුද, යුග ගායනා, සහාය ගායනා කාගෙද වාගේ විස්තර රේඩියෝ එකෙන්ම කියන හන්දා ඒ තොරතුරුත් අර මොනිටර් ඇක්සයිස් පොතේම බෝල අකුරින් ලියා ගන්නවා. ඉතින් ඔය වාගේ පිටු 200 මොනිටර් ඇක්සයිස් පොත් කීපයක්ම වික්ටර් රත්නායක මහත්තයාගෙ සින්දු වලින් පිරුණා. ඇත්තටම ඊට පස්සෙයි අනික් අයගෙ සින්දුත් ඔය විදියට එකතු කරන්න ගත්තෙ. හැබැයි එව්වා ලිව්වෙ වෙනම පොතක.

ඒ දවස්වල පන්, පැන්, පින් තුන්දෙනාටම, "ආරාධනා" "වාසනි" වාගේ ගුවන් විදුලි සංස්ථාවෙ පටිගතකරපු වැඩසටහන් බල්ල ගියේ බොහොම උනන්දුවෙන්. හොයලා බලලා ටිකට් එහෙම අරන් දුන්නෙ කිරුළපණේ ජෙස්ටින් අයියා. ගුවන් විදුලියේ ස්වදේශීය සේවයෙන් රෑ නවයට විතර විකාශය කරපු සංගීත පාඩම තුන්දනා එක්ක ඇහුවෙ නිදි මරාගෙන. සතියෙ දවසකයි ඒ වැඩසටහන තිබුණෙ. පහුවදාට ඉස්කෝලෙ යන්න තියෙන බවත් අමතකයි තුන්දෙනාට.

ඉස්කෝලෙ ඇරිලා ආවගමන් හවස 2.30 ට ගුවන් විදුලියේ කාන්තා ඉල්ලීම් තීරය නොවැරදීම අහනවා. රත්නායක මහත්තයගේ සින්දුවක් වරදින්නෙ බොහොම කලාතුරකින් ඒ කාලෙ. සමහර කාන්තා වැඩසටහන්වල තේමා වාදනය වුණොත් ඒ සින්දුවල වාදන කොටස්. "නුවන් දහක් මැදි වුණා" සින්දුවේ අතුරු වාදනයත්, "ජීවිතේ තුරුණු වසන්තේ" සින්දුවේ අනුවාදනයත් හොඳට මතකයි.

සමරු පොත් ලියවිල්ලත් ඒ දවස්වල බොහොම ජයට තිබුණා. ඒවායේ බොහොම වෙලාවට පන් ලිව්වෙ වික්ටර් රත්නායක මහත්තයගේ සින්දුවල පද. පින් ඇන්දේ ඒ පදවලට ගැලපෙන චිත්‍ර. පැන් කළේ අත්සන් එකතු කරන එක. එක එක තැන්වලදි ගත්ත අත්සන් යට ඒ අත්සන් ගත්ත තැනයි දිනයයි සටහන් කර ගත්තා. ඒ කාලේ සමරු පොත් ලිව්වෙ ගෑණු ළමයි විතරක් නෙවේ.

ඉස්කෝලෙ "නුවණ" සමාජයේ දෙසතියකට සැරයක් සිකුරාදා හවස තියන "නුවණ දිනයේ" තේමා ගීතය වුණේ "මඩොල් දූව" චිත්‍රපටියට රත්නායක මහත්තයා ගායනා කරපු "කොහේද කොහේද අපේ ලොවක්" සින්දුව. ඒ දවස්වල පැන් පෙරදිග තූර්ය වාදන කණ්ඩායමේ උන්නු හන්දා බටනලාවෙන් මේ ගීතය වාදනය කළා මතකයි. තූර්ය වාදක කණ්ඩායමේ සින්දු අතරට "අපි ඔක්කොම රජවරු", "අපි උදේ ගිහිල්ලා", "සඳ හිරු තරු පවතින තුරු", "සරු පස දිලේ", වගේ සින්දු විතරක් නෙවෙයි "සඳත් ඉරත් නැති", "තනි තරුවේ" වගේ සින්දුත් වාදනය කළා. රත්නායක මහත්තයා සංගීතයා කරපු නීලා වික්‍රමසිංහ මහත්මියගේ "සූසැට බරණින්", ප්‍රේඩී සිල්වා මහත්තයාගේ "කුණ්ඩුමනී" වාගේ සින්දු පවා වාදනය කළේ බොහොම උනන්දුවෙන්. කනට ඇහෙන හැටියට වාදනය කරලා ස්වර සටහන් හදලා අනික් අයටත් පුරුදු කළා.

ඉතින් ඔය විදියට ආව ගමනේ හීනෙකින්වත් හිතපු නැති දිහාවකට පන්හිඳ යොමුවෙලා. පන්ති මිත්‍රයෝ ඉස්කෝලෙසි "පන්හිඳ" කියලා දාපු නමට හරියන්න අදටත් ලියනවා. ඉතින් ඒ ලියන දේවල් කාට හරි කියවන්න පුළුවන්නම්, ඒවායින් යමක් ගන්න තියෙනවා නම් ඒ ඔය උනන්දුව පන්ට ඇති කරපු ඒ නිර්මාණවලට පින් සිද්ධ වෙන්න කියලා අපිට කියන්න පුලුවන්. "ස" ප්‍රසංග සංවිධානය කරන්නත් අන්තිමට පින පෑදුනා. සමරුවලට ඇන්දෙත් පින්.

මෙල්බර්න් පත්තරවලට ලියන්න පන්ට ආරාධනා ලැබුණොත් ඒ හන්දා. ඒ නිසාම ඒ හැම ලියවිල්ලක්ම මුලින් පටන් ගත්තෙත් ඒ බව සිහිපත් කරගෙන. ඒ ලියන කරන දේවල්වලට පින්සලගේ ඇඳිල්ලත් දායක කරගත්තා. පැන්සලනං එංගලන්තෙ ඉඳන් ආවේ අවුරුදු කීපයකට කලින්නේ.

"ස" ප්‍රසංගයත්, වික්ටර් රත්නායක මහත්තයත්, ඒ සින්දුත් "පන්හිඳයි, පින්සලයි" ලියවිල්ලට වැදගත් වෙන්නේ ඒ හන්දයි. තමුන්නෙ ම "ස" මතක ලෝකවලට පාවෙලා බලාගත්තු අනේ බලං උන්නු පන්, පින්, පැන් තුන්දෙනාගේ මතක සටහන් ටිකක් "ස" ප්‍රසංගය සමාප්තිය දැකපු මේ වෙලාවේ ලියලා තියන එක කාලීන යුතුකමක් කියලා හිතුනේ ඒ හන්දයි. ■

